## පාර්ලිමේන්තුමය පාලනය සඳහා වන කාරක සභා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය 2011

---

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ ,

(අ) 2011 ජනවාරි 01 සිට 2011 ජුලි 31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2011 ජුලි 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2011 ජනවාරි 01 සිට 2011 ජුලි 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2011 ජුලි 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙනලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඊ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

-----------------------

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරු වලට අනුව, සමාලෝචිත මාස 07 ක කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු. 908,297 ක් වූ අතර 2011 ජූලි 31 දිනට සමුච්චිත වියදම රු. 15,642,617 ක් විය. සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වූ වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2011 ජූලි 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ක්‍රියාකාරකම | 2011 ජනවාරි 01 සිට 2011 ජූලි 31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වියදම | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම | 2011 ජූලි 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (අ) | උපදේශක සේවා | - | 9,398,899 | 9,398,899 |
| (ආ) | භාණ්ඩ | 833,299 | 174,999 | 1,008,298 |
| (ඇ) | පුහුණු කිරීම් හා වැඩමුළු | 74,988 | 5,160,422 | 5,235,420 |
| | එකතුව | 908,297 | 14,734,320 | 15,642,617 |

### 2.2 විශේෂ (ඩොලර්) ගිණුම

-------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව 2011ජූලි 31 දිනෙන් අවසන් මාස හතක කාලපරිච්ඡේදය තුළ විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩොලර් | රු. |
|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 191,271.95 | 21,222,193 |
| අඩුකළා - විදේශ විනිමය පාඩුව | - | 268,394 |
| ආපසු ගැනීම් | - | 908,298 |
| 2011 ජූලි 31 දිනට ශේෂය | 191,271.95 | 20,045,501 |

3. විගණන නිරීක්ෂණ
--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය සඳහා සලසන ලද රු. මිලියන 15 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 0.91 ක් පමණක් ව්‍යාපෘතිය සඳහා වැයකර තිබුණු අතර 93.93% කට සමාන සැලකිය යුතු මුදලක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ කටයුතු 2011 ජුලි 14 දින අවසන් කර තිබුණි. ව්‍යාපෘතියට අදාළව දරන ලද වියදම 2011 ජුනි 30 දිනට අරමුදල් යෙදවීම් ප්‍රකාශය මගින් හෙළිදරව් කර තිබුණි. අරමුදල් යෙදවීමේ ප්‍රකාශය අනුව තථ්‍ය වියදම රු. 15,854,500 ක් වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද 2011 ජුලි 31 දිනට ශේෂපත්‍රයට අනුව වියදම රු. 15,642,617 ක් ලෙස හෙළිදරව් කර තිබුණි. ඉහත ලියවිලි සැසඳීමේදී ශේෂපත්‍රයෙහි රු. 211,883 ක් අඩුවෙන් දක්වා තිබුණු බව අනාවරණය විය.

(ඇ) ව්‍යාපෘති ගිවිසුම අනුව, ක්‍රියාකාරකම් 4 කින් ව්‍යාපෘතිය සමන්විත විය. උපදේශක සේවා, භාණ්ඩ හා පුහුණු සහ වැඩමුළු සඳහා පිළිවෙලින් එ.ජ.ඩො. 284,000, එ.ජ.ඩො.10,000 ක් හා එ.ජ.ඩො. 200,000 ක වෙන්කර තිබුණි. 2010 ජුනි 01 සිට උපදේශක සේවාවන් සපයා නොතිබුණද , උපදේශකවරුන් පත්කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාර සැලැස්මට අනුව ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් ව්‍යාපෘති කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමට කරන ලද ඉල්ලීම ප්‍රත්ක්ෂේප කරන ලද ලෝක බැංකු නියෝජිතයා විසින් 2011 ජුලි 01 වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට නිර්දේශ කර තිබුණි.

4. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**
-------------------------------------

4.1 **අරමුදල උපයෝජනය**
--------------------------

ව්‍යාපෘති කාර්යයේ අරමුදල් යෙදවීම් ප්‍රකාශයට අනුව , සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ සංරචක 4 ක් වෙනුවෙන් වැය කිරීමට රු. 50,472,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණු නමුත් රු.15,854,000 ක් එනම් මුල් ප්‍රතිපාදනයෙන් 31.41% ක් පමණක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. විසතර පහත දැක්වේ.

| | ඇස්තමේන්තුව | තථ්‍ය | විචලනය | |
|---|---|---|---|---|
| | ------------- | ------- | --------- | |
| | රු.(000) | රු.(000) | රු.(000) | % |
| කාරක සභා ලේකම් කාර්යාලයේ ධාරිතාවය වැඩි දියුණු කිරීම | 24,704.4 | 9,079.6 | 15,624.8 | 66.27 |
| කාරක සභා සාමාජිකයන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම | 20,551.2 | 5,838.2 | 14,713.0 | 71.59 |
| පාර්ලිමේන්තු පාලන කාරක සභා පිළිබඳ තොරතුරු මහජනයාට ලබාගැනීම වැඩිදියුණු කිරීම | 4,837.4 | 776.7 | 4,060.7 | 83.97 |
| ව්‍යාපෘති කළමනාකරණය | 379.0 | 160.0 | 219.0 | 57.78 |
| | --------- | ---------- | ---------- | |
| මුළු ව්‍යාපෘති වියදම | 50,472 | 15,854.5* | 38,579.1 | 76.44 |
| | ===== | ====== | ====== | |

* උපදේශකගේ වැටුප් ඇතුළත් කිරීම හේතුවෙන් මෙම මුදල 4.1 ඡේදයේ දැක්වෙන මුදලින් වෙනස් වේ.

4.2 **භෞතික කාර්ය සාධනය**

--------------------------

ව්‍යාපෘතිය විසින් ප්‍රධාන සංරචක 4 ක් යටතේ එහි කටයුතු ක්‍රියාත්මක කර තිබුණද , එක් එක් සංරචකය යටතේ ඉටුකර ගැනීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.